පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 8 වන සතිය

විෂය :- පෙරදිග සංගීතය

Prepared by - කලාප අධ්‍යාපන කායර්ාලය, කෑගල්ල

ශ්‍රේණිය :- 11

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

## සොකරි නාටක සම්ප්‍රදායය පිළිබඳ සංස්කෘතික පසුබිම

සොකරි රංග සම්ප්‍රදායය ශ්‍රී ලංකාවේ උඩරට ප්‍රදේශයේත්, වන්නියේත්, සතර කෝරළයේ ඇතැම් ප්‍රදේශවලත් ව්‍යාප්ත වී ඇති පැරණි ම ගැමි නාටක සම්ප්‍රදායයකි. ප්‍රදේශීය වශයෙන් සොකරි නාටකයේ විවිධ වෙනස්කම් දක්නට ඇත. ලග්ගල, ඉලුක්කුඹුර, බදුල්ල වැනි ප්‍රදේශවල නාමත් එය පැරණි ස්වරූපයෙන් ම නොවෙනස් ව පවතී.

ගොයම් කපා පාගා ගත් 'කමත' සොකරි රඟ දැක්වීම සඳහා රංග භූමිය ලෙස යොදා ගැනේ. මෙහි කතා පුවත පත්තිනි, කතරගම යන දේව ඇදහීම් හා සම්බන්ධ වේ. ශාන්ති කර්ම ස්වරූපයක් ගන්නා සොකරි නාටක කවිවල නාදමාලාවලට උඩරට ශාන්ති කර්ම ගීතවල නාද රටා මුසු වී ඇත. ගද්‍ය සංවාද මෙන් ම පද්‍ය අනුරූප ගායනා ද මඟින් කතා පුවත රඟ දක්වෙන මෙම නාටකය අවසානයේ දේවදානයක් දීමට ද ගැමියෝ අමතක නොකරති.

හොරණෑව, තාලම්පට, ගැටබෙරය (උඩරට බෙරය) සොකරි නාටකයේ යොදා ගන්නා සංගීත භාණ්ඩ ලෙස දැක්විය හැකි ය. ඇතැම් ප්‍රදේශවල දවුල ද, වන්නියේ උඩැක්කිය ද යොදා ගන්නා බවට සාධක තිබේ. සොකරි නාටකයේ එන පරයා චරිතය කොළපත්වලින් තැනූ වෙස් මුහුණක් පලඳියි. මෙහි එන ගැහැනු චරිත පිරිමින් විසින් ම රඟදක්වනු ලබයි. සොකරි නාටකයේ ඇතුළත් ප්‍රබල චරිත ලෙස බෙරකරු, ආඬි ගුරු හෙවත් ගුරුහාමි, වෙද රාල, සොකරිය හා පරයා දැක්විය හැකි ය. කපුරාල, වඩුරාල, බල්ලා, සොත්තානා, කාලි අම්මා ආදි චරිත සෙසු චරිත අතර වේ. කණ්ඩායම් නායකයා (බෙරකරු) කිසියම් සිද්ධියක් කවියෙන් විස්තර කරන විට නළුවෝ එය අනුකරණාත්මක ව නැටුමෙන් රඟ දක්වති.

## සොකරි කතා පුවත

සොකරි නාටකය පිළිබඳව ලියැවුණ විවිධ පුරාවෘත්ත ඇත. එක් ජනප්‍රවාදයකට අනුව එන කතා පුවත මෙසේ ය.

ගුරුහාමි ශිල්ප ශාස්ත්‍රයෙහි කෙළ පැමිණි ආඬි ගුරෙකි. කාසි රට රූමත් කාන්තාවක වූ සොකරිය සරණ පාවා ගන්නා මොහුට 'පරයා' නම් මෙහෙකරුවෙක් ද සිටියි. ජීවනෝපායයක් සොයමින් රටින් රට යන මොවුනට සිංහල දේශයට යාමට සිත් විය. එම නිසා මුහුදු සතක් තරණය කොට ලක්දිවට පැමිණ ශ්‍රී පාදස්ථානය වැඳ පුදාගෙන ලක්දිව දකුණු පළාතේ තඹරාවිට ගමට පැමිණ ගෙපැලක් සාදා ගෙන වාසය කරන්නට සැරසෙති. බස නොතේරෙන බැවින් ඔවුනට වතුර, කෑම ආදිය සොයා ගැනීම අසීරු විය. දිනක් වතුර සොයා යන විට වෙදරාලගේ බල්ලා ගුරුහාමි සපා කයි. ඉතා අමාරුවෙන් නිවසට පැමිණ පොළොවේ වැතිරෙන ගුරුහාමි දුටු පරයා ඔහු මැරී ඇතැයි සිතා සොකරිය අනාචාරයෙහි පොලඹවා ගැනීමට උත්සාහ දරයි. ඊට උරණ වූ සොකරිය වහා ගොස් වෙදකු සොයාගෙන එන ලෙස පරයාට අණ කරයි. පරයා සමඟ නොඑන වෙදරාල කැඳවාගෙන එනු ලබන්නේ සොකරිය විසිනි.

ගුරුහාමිට වෙදකම් කළ වෙදරාල පාන්දර යාමයේ සොකරිය කැටුව පලා යයි. ගුරුහාමි සුව වී සොකරිය නැති සොවින් කතරගම දෙවියන්ට බාරහාර වී කන්නලවු කරයි. ඊ අනුව වෙදරාලගේ නිවසේ දී ගුරුහාමිට සොකරිය හමු වේ. ඒ වන විට සොකරි දරුවකු නළවමින් සිටියි. නැළවිලි ගීයට උදාහරණ ලෙස ''පාට වරුණ පුත පරමණ්ඩල පුත'' ගීතය දැක්විය හැකි ය. දරුවා ද සමඟ සොකරි රැගෙන එන ගුරුහාමි, නාට්‍ය නරඹන ප්‍රේක්ෂකයන් අතට දරුවා පත් කරයි.

මෙය කෘෂිකාර්මික සමාජයක 'සශ්‍රීකත්වයේ සංකේතයක්' ලෙස සැලකේ.

## සොකරි නාටක ගීත

1. වෙදා නටන්නේ පළමු ව සබයට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙවුලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ
විදා පාන්නේ අත් දෙක නැගී කියන්නේ

2. සොකරි එන්නී සබයෙන් අවසර ගන්නී
නැටුම් නටන්නී තාලෙට රාග කියන්නී
පද අල්ලන්නී පියයුරු ළැම සොලවන්නී
කැඩපත ගන්නී සුරතින් මුහුණ බලන්නී

### I නාද මාලාව

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සසග | රිරි- | රි-රි | ගරිස | සසග | රිරි- | රි-- | ගරිස |
| සොකරි | sඑන් | නීsස | බයෙන් | අවස | රගන් | නීss | sss |
| සසග | රිස- | ස-ධ | ගරිග | රිසස | සස- | ස-- | --- |
| නැටුම් | නටන් | නීsතා | sලෙට | රාsග | කියන් | නීss | sss |

### II නාද මාලාව

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සසරි | ගග- | ග-රි | ගරිස | ස-රි | ගරි- | රි-- | ගරිස |
| සොකරි | sඑන් | නීsස | බයෙන් | අවස | රගන් | නීss | sss |
| සසරි | ගග- | ග-රි | ගරිස | ස-රි | ගරි- | ස-- | --- |
| නැටුම් | නටන් | නීsතා | sලෙට | රාsග | කියන් | නීss | sss |

ඉතිරි ගී පාද ද මේ තනුවට ම ගැයේ

3. පාට වරුණ පුත - පර මණ්ඩල පුත
හුඹ නාඩන් පුත - හරි රාරෝ
තින්ද තොටිල්ලේ - නැළවෙන් මගෙ පුත
හුඹ නාඩන් පුත - හරි රාරෝ

| | | | |
|---|---|---|---|
| + සරි ග ග | රි ස සරි ග | + රි ග රි ස | ස රි ස නි |
| + පාs ට ව | රු ණ පුs ත | + පර ම ණ් | ඩ ල පු ත |
| + නිස ස ස | ස - සරි ග | + රි ග රි ස | ස - - - |
| + හුඹ නා s | ඩ න් පුs ත | + හරි රා s | රෝ s s s |

ප්‍රදේශීය වශයෙන් ගී පදවල හා තනුවල සුළු වෙනස්කම් දකිය හැකි වේ. සොකරි ගී තනු බොහෝ විට ඒකාකාරී ය. ඒකල ව ගයන සෑම ගී පෙළක් ම අත්වැල් ගායක පිරිස නැවත ගයති. බොහෝ විට අවුරුද්දේ වෙසක්, පොසොන් මාසවලට පමණක් සීමා වී දින හතක් රඟ දක්වන සොකරි නාටකය කෙළවර වන්නේ බාරහාර ඔප්පු කර නිකිණි පුර පසළොස්වක දිනයේ පවත්වන සොකරි පෙරහැරකිනි.

**පැවරුම**

1. සොකරි ගැමි නාටකය වඩාත් ප්‍රචලිත ප්‍රදේශ මොනවාද?

2. ඒ අතරින් අදටත් ඉපැරණි සම්ප්‍රදාය නොවෙනස්ව පවතින ප්‍රදේශ 2ක් නම් කරන්න.

3. .................. සොකරි සඳහා රංග භූමිය වූ අතර ............ දෙවියන් හා ............ දෙවියන් මූලික වී ඇති බව ජනප්‍රවාදයේ සඳහන් වේ.

4. සොකරි සඳහා වාදනයෙන් සහය වූ වාද්‍ය භාණ්ඩ මොනවාද?

5. සොකරි ගැමි නාටකයේ විශේෂ ලක්ෂණ 2ක් සඳහන් කරන්න.

6. සොකරි හි ප්‍රබල චරිත 5 නම් කරන්න.

7. සොකරි නාටකයේ ඔබ උගත් ගීතයක් ලියා දක්වන්න.